ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01. ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2019 අප්‍රේල් මස 22 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2019 පෙබරවාරි

### සමස්ත නිරීක්ෂණ

- වසර පහකට වඩා වැඩි කාලයකට පසුව වූ අඩුම වෙළඳ හිඟය වාර්තා කරමින් 2019 වසරේ පෙබරවාරි මාසයේදී වෙළඳ හිඟය එ.ජ. ඩොලර් මිලියන 451 ක් දක්වා තවදුරටත් අඩු විය.
- 2019 වසරේ පෙබරවාරි මාසයේදී වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීමට, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව ආනයන වියදම සියයට 27.6 කින් කැපී පෙනෙන ලෙස අඩු වීම සහ අපනයන ආදායම සියයට 7.2 කින් වර්ධනය වීම හේතු විය.
- 2018 වසරේ දෙසැම්බර් මාසයේ සිට සංචාරක පැමිණීම් මාසිකව 240,000 කට වඩා වැඩි ප්‍රමාණයක් වාර්තා කරමින් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව 2019 වසරේ පෙබරවාරි මාසයේදී සංචාරක පැමිණීම් සියයට 7.0 ක වර්ධනයක් වාර්තා කළ අතර එමගින් සංචාරක ඉපැයීම්හි ඉහළ වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගත්තේය.
- 2019 පෙබරවාරි මාසයේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 500 දක්වා සියයට 12.4 කින් අඩු විය .
- 2019 වසරේ පෙබරවාරි මාසයේදී කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ශුද්ධ ගෙවීම් වාර්තා වුවද, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් වාර්තා කරමින් මූල්‍ය ගිණුමෙහි ධනාත්මක ප්‍රවණතා පිළිබිඹු කළේය.
- වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීම සමඟ, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම්, 2019 වසරේ ජනවාරි මාසයේදී එ.ජ. ඩොලර් බිලියනයක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීමෙන් පසුව වෙළඳපොළ විශ්වාසය නැවත ස්ථාපිත වීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සමීපස්ථ ණය පහසුකම අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා නිලධාරි මට්ටමේ සාකච්ඡා සාර්ථකව සිදු කිරීම මෙන්ම එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව ඇතුළු අනෙකුත් දියුණු ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්තිය යම් ඉවසිලිමත් ස්වභාවයකින් සිදු කිරීම සමඟ 2019 වසරේ පෙබරවාරි මාසය අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට

1.6 කින් අතිප්‍රමාණය විය. විනිමය අනුපාතිකය ඉන් අනතුරුව ද තවදුරටත් අතිප්‍රමාණය වූ අතර, 2019 වසරේ අප්‍රේල් 22 දක්වා කාලපරිච්ඡේදය තුළදී සියයට 4.8 කින් අතිප්‍රමාණය විය.

- 2019 වසරේ පෙබරවාරි මස අවසානය වන විට රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6.0 ක් වූ අතර, එය ආනයනික මාස 3.4 කට සමාන විය. ඉන්පසු, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමෙන් වූ ලැබීම් ද සමඟ 2019 වසරේ මාර්තු මස අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.6 දක්වා ඉහළ ගොස් ඇති බවට ඇස්තමේන්තු කර ඇත.
- මේ අතර, 2019 වසරේ ජනවාරි මාසයේදී කල්පිරුණු එ.ජ. ඩොලර් බිලියනයක සහ 2019 වසරේ අප්‍රේල් මස දෙවන සතිය තුළදී කල්පිරුණු එ.ජ. ඩොලර් මිලියන 500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර රජය විසින් නියමිත පරිදි පියවන ලදී.

**සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වයෙහි සාරාංශය (අ)**

| කාණ්ඩය | 2018 පෙබ. (එ.ජ. ඩො. මිලියන) | 2019 පෙබ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | 2018 ජන.-පෙබ. (එ.ජ. ඩො. මිලියන) | 2019 ජන.-පෙබ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 916 | 981 | 7.2 | 1,881 | 2,019 | 7.3 |
| ආනයන | 1,978 | 1,432 | -27.6 | 3,992 | 3,088 | -22.7 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -1,062 | -451 | | -2,111 | -1,069 | |
| සංචාරක ඉපැයීම් (ආ) | 442 | 473 | 7.0 | 891 | 932 | 4.6 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 572 | 500 | -12.4 | 1,301 | 1,046 | -19.6 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | 18 | -15 (ඈ) | | 54 | -29 (ඈ) | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 290 | 230 | | 583 | 511 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 95 | 95 | | 265 | 167 | |
| දිගුකාලීන ණය | 195 | 135 | | 318 | 344 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | - | - | | - | - | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | - | - | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | - | - | |
| සමස්ත ශේෂය | | | | -0.4 | -858 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය
(ඇ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ
(ඈ) ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු පිළිබඳ දත්ත පවතිනුයේ 2019 ජනවාරි සඳහා පමණි

## වෙළඳ ශේෂය සහ වෙළඳ මිල අනුපාතය

- අපනයන ආදායම ඉහළ යෑම සහ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් 2019 පෙබරවාරි මාසයේදී වෙළඳ ගිණුමේ හිඟය 2013 ඔක්තෝබර් මාසයෙන් පසු වාර්තා කළ පහළම අගය සටහන් කරමින් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය. ආනයනවල පහළ යෑම මගින් ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතිකය මත වූ

දැඩි පීඩනය අඩු කිරීමේ අරමුණින් ඇතැම් ආනයන අධෛර්යවත් කිරීම සඳහා මහ බැංකුව සහ රජය විසින් හඳුන්වා දුන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම පෙන්නුම් කරයි. සමුච්චිත වශයෙන් සැලකීමේදී, 2019 වසරේ පළමු මාස දෙක තුළදී වෙළඳ ගිණුමේ හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය.

- මේ අතර, අපනයනවලට සාපේක්ෂව ආනයනවල මිල නිරූපණය කරන වෙළඳ මිල අනුපාතය, ආනයන මිල ගණන් පහළ යෑමේ වේගයට සාපේක්ෂව අඩු වේගයකින් අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන්, 2019 පෙබරවාරි මාසයේදී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 119.7 ක් දක්වා සියයට 2.9 කින් වර්ධනය විය.

**රූප සටහන 1: මාසික වෙළඳ ක්‍රියාකාරිත්වය - (2018-2019)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2: වෙළඳ මිල අනුපාතය - (2018-2019)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

- 2019 පෙබරවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 981 ක් දක්වා සියයට 7.2 කින් වර්ධනය විය. අපනයනවල වර්ධනය සඳහා කාර්මික අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය ප්‍රධාන වශයෙන් හේතු වූ අතර කෘෂිකාර්මික අපනයන සුළු වශයෙන් යථා තත්ත්වයට පත්වීම ද හේතු විය.
- කාර්මික අපනයන සැලකූවිට, 2019 පෙබරවාරි මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර ඒ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය යන සාම්ප්‍රදායික වෙළඳපොළවලින් මෙන්ම ඉන්දියාව, ජපානය, කැනඩාව සහ චීනය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් ඇඟලුම් සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. රෙදිපිළි හා වෙනත් රෙදිපිළි සැකසුම් අපනයන ආදායම ද 2019 පෙබරවාරි මාසයේදී කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. තවද, ධාන්‍ය සැකසුම් හැරුණු විට, අනෙකුත් සියලුම උපකාණ්ඩවල වූ ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම මෙම මාසය තුළදී ඉහළ ගියේය. 2019 පෙබරවාරි මාසයේ කාර්මික අපනයන ඉහළ යෑම සඳහා මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, රබර් නිෂ්පාදිත, දැව හා කඩදාසි නිෂ්පාදිත, සත්ත්ව ආහාර, සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම් ද දායක වී ඇත. කෙසේ වුවද, පසුගිය වසර තුළ කැපී පෙනෙන ලෙස ඉහළ ගිය ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම 2019 පෙබරවාරි

මාසයේදී අඛණ්ඩව නෙවන මාසයටත් පහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් නැව් සහ ගුවන් යානා ඉන්ධන අපනයන ආදායම පහළ යෑම හේතු විය. මීට අමතරව, 2019 පෙබරවාරි මාසයේදී සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන්, ප්‍රවාහන උපකරණ සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම ද පහත වැටුණි.

- ප්‍රධාන වශයෙන් කුළුබඩු, මුහුදු ආහාර සහ පොල් අපනයන ක්‍රියාකාරිත්වය ඉහළ යෑම හේතුවෙන් 2019 පෙබරවාරි මාසයේදී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව කෘෂිකාර්මික අපනයන ආදායම සුළු වශයෙන් වර්ධනය විය. කරාබු නැටි සහ කුරුඳු අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළදී කුළුබඩු අපනයන ආදායම ඉහළ ගියේය. තවද, යුරෝපා වෙළඳපොළ වෙතින් වූ ඉහළ ඉල්ලුම හේතුවෙන් 2019 පෙබරවාරි මාසයේදී මුහුදු ආහාර අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපෙක්ෂව කැපී පෙනෙන ලෙස අඛණ්ඩව වර්ධනය විය. පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියද, දිසිදි පොල් මූලික කර ගත් පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ඉහළ යෑම හේතුවෙන් පොල් අපනයන ආදායම ඉහළ ගියේය. මේ අතර, 2019 පෙබරවාරි මාසයේදී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ එළවළු අපනයන ආදායම ඉහළ ගියේය. 2019 පෙබරවාරි මාසයේදී තේ අපනයන පරිමා වර්ධනය වුවද, තේ සඳහා වූ සාමාන්‍ය අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම පහත වැටුණි.
- සියලුම උපකාණ්ඩවල වාර්තා වූ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් ඛනිජ ද්‍රව්‍ය අපනයන ආදායම පහළ ගියේය.
- 2019 පෙබරවාරි මාසයේදී අපනයන පරිමා දර්ශකය සියයට 11.0 ක වර්ධනයක් ද අපනයන මිල දර්ශකය සියයට 3.4 ක පහළ යෑමක් ද වාර්තා කළ අතර එමගින් 2018 පෙබරවාරි මාසය හා සැසඳීමේදී අපනයන ආදායමෙහි වූ වර්ධනය සඳහා මිල ගණන් නොව පරිමාව ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වූ බව පිළිබිඹු කරයි.

**රූප සටහන 3: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 4: මාසික අපනයන පරිමා දර්ශකය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2018 පෙබ. (එ.ජ. ඩො. මිලියන) | 2019 පෙබ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | 2018 ජන.-පෙබ. (එ.ජ. ඩො. මිලියන) | 2019 ජන.-පෙබ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **703.2** | **769.5** | **9.4** | **1,460.9** | **1,595.9** | **9.2** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 29.6 | 35.5 | 19.9 | 77.8 | 88.6 | 13.9 |
| සත්ත්ව ආහාර | 7.8 | 9.7 | 24.9 | 14.9 | 26.6 | 78.4 |
| රෙදිපිළි හා ඇඟලුම් | 407.0 | 465.6 | 14.4 | 841.8 | 941.5 | 11.8 |
| එයින් ඇඟලුම් | 381.5 | 434.0 | 13.8 | 790.8 | 878.5 | 11.1 |
| රෙදිපිළි | 18.1 | 23.3 | 28.9 | 36.6 | 46.3 | 26.3 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 7.4 | 8.3 | 11.7 | 14.4 | 16.7 | 16.2 |
| රබර් නිෂ්පාදිත | 68.3 | 69.7 | 2.0 | 139.4 | 150.3 | 7.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 23.1 | 27.1 | 17.5 | 50.6 | 51.2 | 1.3 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 31.4 | 32.2 | 2.7 | 61.1 | 69.1 | 13.0 |
| ප්‍රවාහන උපකරණ | 7.9 | 7.2 | (8.6) | 15.2 | 16.1 | 5.3 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 45.5 | 38.6 | (15.2) | 98.2 | 76.0 | (22.6) |
| රසායනික නිෂ්පාදිත | 12.6 | 13.2 | 5.0 | 25.1 | 28.1 | 11.8 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 12.2 | 15.4 | 26.8 | 23.5 | 27.5 | 17.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 1.1 | 0.8 | (31.4) | 2.7 | 6.9 | 158.2 |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 14.8 | 10.6 | (28.5) | 27.8 | 23.7 | (14.8) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.8 | 5.4 | (21.2) | 13.1 | 12.2 | (6.7) |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 11.2 | 15.2 | 36.4 | 23.3 | 29.3 | 26.0 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.2 | 2.4 | 7.8 | 4.1 | 4.8 | 15.3 |
| වෙනත් | 21.8 | 20.9 | (4.1) | 42.3 | 44.1 | 4.3 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **206.1** | **207.8** | **0.8** | **410.2** | **415.4** | **1.3** |
| තේ | 118.2 | 110.6 | (6.4) | 230.0 | 221.4 | (3.8) |
| රබර් | 4.1 | 2.3 | (42.9) | 8.1 | 5.1 | (37.0) |
| පොල් | 26.3 | 27.3 | 3.9 | 47.5 | 53.0 | 11.8 |
| කුළුබඩු | 24.6 | 28.6 | 16.0 | 54.7 | 56.4 | 3.2 |
| එළවළු | 1.6 | 2.5 | 57.0 | 3.5 | 5.1 | 47.3 |
| සකස් නොකළ දුම්කොළ | 3.6 | 1.9 | (48.7) | 5.4 | 4.0 | (25.9) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.2 | 9.3 | 13.5 | 18.7 | 17.7 | (5.5) |
| මුහුදු ආහාර | 19.5 | 25.3 | 29.9 | 42.4 | 52.7 | 24.2 |
| **3. ඛනිජ අපනයන** | **4.8** | **2.2** | **(54.9)** | **6.2** | **4.6** | **(26.9)** |
| **1. වර්ග නොකළ අපනයන** | **1.5** | **1.6** | **10.5** | **3.7** | **3.4** | **(8.6)** |
| **මුළු අපනයන** | **915.7** | **981.1** | **7.2** | **1,881.0** | **2,019.3** | **7.3** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

- තෝරාගත් ආනයන කාණ්ඩ කිහිපයක් අධෛර්යවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහ 2018 වසරේ අවසාන භාගයේදී විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමේ බලපෑම පිළිබිඹු කරමින් වෙළඳ භාණ්ඩ ආනයන වියදම 2014 මැයි මාසයෙන් පසුව වූ අවම අගය වාර්තා කරමින් 2019 පෙබරවාරි මාසයේදී සැලකිය යුතු ලෙස පහත වැටුණි. ඒ අනුව ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,432 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 27.6 කින් පහත වැටුණු අතර සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ වන අන්තර් භාණ්ඩ, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා දරන ලද වියදම අඩු වීම මේ සඳහා හේතු විය. ඉන්ධන නොවන ආනයන වියදම ද සැලකිය යුතු ලෙස පහත වැටුණි.
- මූල ලෝහ හැර අනෙකුත් සියලුම උපකාණ්ඩවල ආනයන පහළ යෑම හේතුවෙන් 2019 පෙබරවාරි මාසයේදී අන්තර් භාණ්ඩ අනයන වියදම පහත වැටුණි. 2018 අප්‍රේල් මාසයේදී රත්‍රන් ආනයනය මත තීරු බදු පැනවීමේ බලපෑම පිළිබිඹු කරමින් 2019 පෙබරවාරි මාසයේදී ද රත්‍රන් ආනයන වියදම අඛණ්ඩව ඉතා පහළ අගයක පැවතුණි. පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ගල් අඟුරු ආනයන පරිමා සහ මිල ගණන් අඩුවීම හේතුවෙන් මෙම මාසයේදී ඉන්ධන ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, නඩත්තු කටයුතු සඳහා තෙල් පිරිපහදුව වසා තැබීම හේතුවෙන් 2018 පෙබරවාරි මාසයේදී බොරතෙල් ආනයනය නොකළද 2019 පෙබරවාරි මාසයේදී බොරතෙල් ආනයනය කරන ලදී. තවද, ප්‍රධාන වශයෙන් රෙදි වර්ග ආනයනය පහත වැටීම හේතුවෙන් 2019 පෙබරවාරි මාසයේදී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පහත වැටුණි. මේ අතර, 2019 පෙබරවාරි මාසයේදී තිරිඟු හා ඉරිඟු, රසායනික නිෂ්පාදිත, පොහොර සහ ඛනිජ නිෂ්පාදිත ආනයනය පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් යකඩ හා වානේ ආනයනය ඉහළ යෑම හේතුවෙන් මූල ලෝහ ආනයන වියදම ඉහළ ගියේය.
- ආහාර සහ පානවර්ග සහ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ යන කාණ්ඩ දෙක යටතේම වර්ගකර ඇති බොහෝ ආනයන අඩුවීම පිළිබිඹු කරමින් 2019 පෙබරවාරි මාසයේදී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම කැපී පෙනෙන ලෙස පහත වැටුණි. 2018 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහය සමඟ 2019 පෙබරවාරි මාසයේදී පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයන වියදම අඛණ්ඩව තෙවැනි මාසයටත් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර එමගින් විදේශීය අංශය සහ විනිමය අනුපාතිකය මත පීඩනය අඩු විය. මීට අමතරව, මෙම මාසයේදී ගෘහ උපකරණ, රෙදිපිළි හා උපාංග, විදුලි සංදේශ මෙවලම් සහ ගෘහ හා දැව භාණ්ඩ වැනි බොහෝ ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා වූ ආනයන වියදම පහත වැටුණි. තවද, මෙම මාසයේදී ආහාර හා පානවර්ග යටතේ වර්ග කර ඇති සහල්, සීනි, කිරි නිෂ්පාදිත, එළවළු සහ මුහුදු ආහාර ආනයන වියදම පහත වැටුණි. කෙසේ වුවද, 2019 පෙබරවාරි මාසයේදී කුළුබඩු සහ පාන වර්ග ආනයන වියදම ඉහළ ගියේය.
- සියලුම උපකාණ්ඩවල ආනයන පහළයෑමත් සමඟ 2019 පෙබරවාරි මාසයේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ද පහත වැටුණි. ප්‍රධාන වශයෙන් ඉංජිනේරු උපකරණ, මුද්‍රණ යන්ත්‍ර,

රෙදිපිළි කර්මාන්තය සඳහා භාවිතා කරන යන්ත්‍ර සහ කාර්යාල කටයුතු සඳහා භාවිතා කරන යන්ත්‍ර ආනයනය පහළ යෑම හේතුවෙන් මෙම මාසයේදී යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම පහත වැටුණි. සිමෙන්ති, ප්ලාස්ටික්, රබර් හා වීදුරු භාණ්ඩ, සහ දැව නිෂ්පාදිත ආනයනය පහත වැටීම පිළිබිඹු කරමින් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහත වැටුණි. 2019 පෙබරවාරි මාසයේදී ප්‍රවාහන උපකරණ ආනයන වියදම අඩුවීම සඳහා බස්රථ, ලොරි, ත්‍රීරෝද රථ සහ ටැංකි හා බවුසර ආනයන වියදම අඩුවීම විශාල වශයෙන් දායක විය.

- 2019 පෙබරවාරි මාසයේදී, ආනයන පරිමා සහ ආනයන මිල දර්ශකය පිළිවෙළින් සියයට 22.8 කින් සහ සියයට 6.1 කින් පහත වැටුණි. මේ අනුව, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන වියදම පහත වැටීම සඳහා ආනයන පරිමාව මෙන්ම ආනයන මිල ගණන් පහළ යෑම ද හේතු විය.

**රූප සටහන 5: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 6: මාසික ආනයන පරිමා දර්ශකය**




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 7: පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම - 2018/19**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2018 පෙබ. (එ.ජ. ඩො. මිලියන) | 2019 පෙබ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | 2018 ජන.-පෙබ. (එ.ජ. ඩො. මිලියන) | 2019 ජන.-පෙබ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **441.8** | **259.9** | **(41.2)** | **883.3** | **560.4** | **(36.6)** |
| ආහාර හා පාන වර්ග | 165.3 | 85.7 | (48.1) | 349.0 | 196.9 | (43.6) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය හා ආශ්‍රිත නිෂ්පාදිත | 25.1 | 3.2 | (87.3) | 58.3 | 7.1 | (87.7) |
| එයින් සහල් | 23.5 | 1.0 | (95.7) | 54.8 | 3.3 | (93.9) |
| කිරි නිෂ්පාදිත | 26.9 | 6.1 | (77.3) | 58.8 | 24.0 | (59.2) |
| එළවළු | 30.7 | 19.9 | (35.2) | 70.5 | 44.5 | (36.9) |
| මුහුදු ආහාර | 20.6 | 14.9 | (28.0) | 41.3 | 33.3 | (19.3) |
| සීනි හා රසකැවිලි | 31.0 | 13.9 | (55.2) | 58.7 | 28.9 | (50.8) |
| කුළුබඩු | 7.0 | 10.0 | 42.5 | 14.6 | 18.8 | 28.9 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 23.9 | 17.8 | (25.8) | 46.9 | 40.3 | (14.0) |
| **ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | 276.5 | 174.2 | (37.0) | 534.3 | 363.5 | (32.0) |
| පෞද්ගලික රථවාහන | 113.7 | 48.1 | (57.7) | 208.8 | 97.7 | (53.2) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 38.5 | 36.4 | (5.6) | 82.6 | 77.7 | (6.0) |
| ගෘහ උපකරණ | 28.4 | 15.4 | (45.8) | 47.3 | 29.7 | (37.2) |
| රෙදිපිළි හා උපාංග | 32.3 | 24.2 | (25.1) | 69.8 | 52.6 | (24.7) |
| විදුලි සංදේශ මෙවලම් | 24.2 | 18.4 | (23.9) | 48.6 | 38.8 | (20.1) |
| ගෘහ හා දැව භාණ්ඩ | 17.3 | 11.4 | (33.9) | 33.1 | 24.8 | (25.0) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 22.2 | 20.3 | (8.5) | 44.2 | 42.4 | (4.1) |
| **2. අන්තර් භාණ්ඩ** | **1,096.3** | **831.0** | **(24.2)** | **2,229.7** | **1,787.1** | **(19.8)** |
| ඉන්ධන | 315.2 | 281.8 | (10.6) | 677.2 | 610.8 | (9.8) |
| එයින් බොරතෙල් | - | 48.0 | - | 103.4 | 135.8 | 31.3 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 268.9 | 201.5 | (25.1) | 492.8 | 387.5 | (21.4) |
| ගල් අගුරු | 46.3 | 32.4 | (30.1) | 81.0 | 87.5 | 8.1 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 120.0 | 16.4 | (86.4) | 224.8 | 32.9 | (85.4) |
| එයින් රත්‍රන් | 111.9 | 0.7 | (99.3) | 205.7 | 0.8 | (99.6) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 247.3 | 212.2 | (14.2) | 492.5 | 474.7 | (3.6) |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 40.7 | 31.0 | (23.9) | 83.8 | 69.6 | (17.0) |
| කෘෂිකාර්මික යෙදවුම් | 15.1 | 12.6 | (16.7) | 28.0 | 27.8 | (0.6) |
| තිරිඟු හා ඉරිඟු | 43.7 | 26.7 | (38.9) | 74.8 | 41.2 | (44.9) |
| මූල ලෝහ | 47.9 | 59.4 | 24.1 | 107.5 | 106.1 | (1.2) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 56.9 | 43.3 | (23.8) | 111.6 | 96.3 | (13.7) |
| රසායනික නිෂ්පාදිත | 75.0 | 60.3 | (19.7) | 149.5 | 136.4 | (8.7) |
| පොහොර | 20.3 | 5.3 | (73.8) | 62.7 | 9.1 | (85.5) |
| රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 19.3 | 16.0 | (17.3) | 45.8 | 35.6 | (22.1) |
| වෙනත් අන්තර් භාණ්ඩ | 94.8 | 66.0 | (30.4) | 171.5 | 146.6 | (14.5) |
| **3. ආයෝජන භාණ්ඩ** | **380.5** | **341.0** | **(10.4)** | **817.4** | **739.5** | **(9.5)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 200.4 | 193.9 | (3.2) | 440.7 | 425.1 | (3.5) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 123.0 | 108.8 | (11.6) | 266.1 | 240.8 | (9.5) |
| ප්‍රවාහන උපකරණ | 56.2 | 38.0 | (32.4) | 108.9 | 72.8 | (33.2) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.9 | 0.3 | (70.0) | 1.6 | 0.8 | (50.2) |
| **4. වර්ග නොකළ ආනයන** | **59.3** | **0.5** | **(99.1)** | **62.2** | **0.8** | **(98.7)** |
| **මුළු ආනයන** | **1,978.0** | **1,432.4** | **(27.6)** | **3,992.5** | **3,087.9** | **(22.7)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

- 2019 වසරේ පෙබරවාරි මාසයේ පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව 252,033 ක් ලෙස එය ඉතිහාසයේ මාසිකව වාර්තා වූ දෙවැනි ඉහළම සංචාරක පැමිණීම් සංඛ්‍යාව බවට පත්වෙමින් පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 7.0 ක වර්ධනයක් පෙන්නුම් කළේය. එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව සහ කැනඩාව යන රටවලින් පැමිණි සංචාරකයින් මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.
- 2019 වසරේ පළමු මාස දෙක තුළදී සංචාරක පැමිණීම් ප්‍රමාණය 496,272 ක් වූ අතර, එය 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.6 ක වර්ධනයකි.
- 2019 පෙබරවාරි මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 473 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර 2019 වසරේ පළමු මාස දෙක තුළදී සමුච්චිත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 932 ක් ලෙස වාර්තා විය.
- 2019 පෙබරවාරි මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 500 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 12.4 කින් පහළ ගියේය. සමුච්චිත පදනම මත 2019 වසරේ පළමු මාස දෙක තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 1,046 ක් දක්වා සියයට 19.6 කින් පහළ ගියේය.

**රූප සටහන 8 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර (පෙබරවාරි)**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 9 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, බලපත්‍රලාභී වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්

- 2019 පෙබරවාරි මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතට විදේශීය ආයෝජන ශුද්ධ ලැබීමක් වාර්තා විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන 2019 පෙබරවාරි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 41 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස දෙක තුළදී එ.ජ. ඩොලර් මිලියන 12 ක ශුද්ධ ලැබීමක් වාර්තා විය.
- ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු පමණක් අන්තර්ගත කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන 2019 පෙබරවාරි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 15 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. සමුච්චිත පදනම මත, 2019 වසරේ පළමු මාස දෙක තුළදී (2019 පෙබරවාරි මාසයේ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු නොමැතිව) කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් එ.ජ. ඩොලර් මිලියන 29 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.
- 2019 පෙබරවාරි මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය, එ.ජ. ඩොලර් මිලියන 69 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

- 2019 පෙබරවාරි මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 6.0 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ආනයනික මාස 3.4 කට සමාන විය. දළ නිල සංචිත හා බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2019 පෙබරවාරි මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 8.7 ක් වූ අතර, එය ආනයනික මාස 4.9 කට සමාන විය.
- තවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු තුළින් වූ ලැබීම්ද සමඟ 2019 මාර්තු මස අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 7.6 ක් දක්වා වැඩිවී ඇතැයි ඇස්තමේන්තුගත කර ඇත.

**රූප සටහන 10 : දළ නිල සංචිත සහ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

- 2019 වසරේ අප්‍රේල් 22 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 4.8 කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල අනෙකුත් සියලු ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

**රූප සටහන 11 :**

**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**

**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2018 | 2019 (අප්‍රේල් 22 දක්වා) අවප්‍රමාණය (-)/ අතිප්‍රමාණය (+) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -16.4% | +4.8% |
| යුරෝ | -12.7% | +6.6% |
| ස්ටර්ලින් පවුම | -11.4% | +2.3% |
| ජපන් යෙන් | -18.1% | +6.2% |
| කැනේඩියානු ඩොලරය | -9.3% | +2.7% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -7.6% | +3.4% |
| ඉන්දියානු රුපියල | -8.7% | +3.9% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව